ශ්‍රී. බු. ව. 2558 ක්වූ වප් මස කලාපය, රා. ව. 2014 ක්වූ ඔක්තෝම්බර් මස 08 වන දින

මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

<u>කට ප්‍රවේසම් කරගෙන නීරෝගීව සහනයෙන් ජීවත් වෙමු.</u>




ගරු ස්වාමීන් වහන්ස, කාරුණික පින්වත්නි,

1. පුරිස සසහි ජාතසස කුඨාරි ජායතෙ මුඛෙ

   යාය ඡින්දති අතතානං බාලො දුබභාසිතං භණං

2. යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො

   විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

(අඞගුත්තර නිකාය දසක නිපාත කොකාලික සූත්‍රය)

1. නරක වචන කථාකරන බාලයාගේ කටේ ඇති කෙටේරිය එම නරක වචනයි. ඒ තුළින් ඔහු තමාම විනාශ කර ගනී.

2. යමෙක් නින්දා කළ යුතු පුද්ගලයාට ප්‍රශංසා කරයිද, ප්‍රශංසා කළ යුතු පුද්ගලයාට නින්දා කරයිද, ඔහු කටින් අපරාධ රැස්කරයි. ඒ අපරාධ තුළින් ඔහුට සැප නොලැබේ.

අද වප් පුර පසළොස්වක පොහොය දිනයයි. මේ වර්ෂයේ වස්කාලය අවසන් වන්නේ මෙම පෝය දිනයෙනි. අද සිට ඉල් පොහොය දිනය දක්වා කඨින පිංකම් සිදුවේ. බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොව වස් වසා වැඩ සිට නැවත සංකස්ස නුවරට වැඩම කළේ අද වැනි වප් පුර පසළොස්වක පොහොය දිනයකය. ලක් බුදු සසුන පිහිටුවීම සඳහා සංඝමිත්තා මෙහෙණිය වැඩමවා ගෙන ඒමට අරිට්ඨ ඇමතිවරයා ඉන්දියාවට යාම, ථූපාරාමයේ විනය සංගායනාවක් ආරම්භ කිරීම ආදී වැදගත් සිදුවීම් සිදුවූයේ අද වැනි පොහොය දිනයකය.

මෙවැනි පොහෝ දිනක මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ කට ප්‍රවේශම් කරගෙන සහනයෙන් ජීවත්වීමේ මග කියාදීමටය. නූතන සමාජය තුළ බොහෝ දෙනා අසහනයෙන් ජීවත් වන්නේ කට ප්‍රවේශම් කර නොගැනීම නිසාය. මේ ප්‍රශ්නය අද වගේම පැරණි භාරතය තුළත් පැවතිනි. බුදුරජාණන් වහන්සේ වැඩසිටි සමයෙහි කෝකාලික නම් භික්ෂුවක් තම කට නිසා විනාශ වූ හැටි පෙළ දහමේ සඳහන් වේ. සංයුත්ත නිකායේ පඨම කෝකාලික, දුතිය කෝකාලික නමින් සූත්‍ර දෙකක් සඳහන් වේ. සුත්ත නිපාත පාලිය, අංගුත්තර නිකාය යන තැන් වලද කෝකාලික නමින් සූත්‍ර දෙකක් ඇත. ජාතක පාලියේද කෝකාලික නමින් ජාතකයක් සඳහන් වී ඇත. මේ මූලාශ්‍ර අතරින් අප මේ සදහම් පණිවිඩයට උපයෝගී කරගෙන ඇත්තේ අංගුත්තර නිකායේ දසක නිපාතයේ සඳහන් කෝකාලික සූත්‍රයේ එන ඉහත සඳහන් ගාථා දෙකයි.

කෝකාලික නම් භික්ෂුව සැරියුත් මුගලන් දෙනම කෙරෙහි ද්වේශයෙන් යුක්තව බැණ වැදෙමින් කටයුතු කළහ. සැරියුත් මුගලන් දෙනම පාපීය, පාපී සිතුවිලි වලට වසඟ වී ඇත. යනු කෝකාලික හිමියන්ගේ අදහසයි. බුදුරජාණන් වහන්සේ තෙවරක්ම කෝකාලික භික්ෂුවට දේශනා කළේ කෝකාලිකය, එහෙම කියන්න එපා. සැරියුත් මුගලන් දෙනම සිල්වත්ය.ඒ දෙනම කෙරෙහි පවත්නා ද්වේශය දුරුකර ගන්න. නමුත් කෝකාලික භික්ෂුව එම අදහස ඉවත් කරගත්තේ නැත. ටික දිනක් ගතවූ පසු කෝකාලික භික්ෂුවගේ ඇඟ පුරාම බිබිලි හට ගත්තේය. ඒවා විශාල වී මුළු ශරීරයම කුණුවී ගියහ. අන්තිමේදී විසක් ගිලින ලද මාලුවෙකු සේ ගැහෙමින් කෙසෙල් කොළ උඩ නිදාගත්හ. මේ නිසාම ඔහු මියගොස් පදුම නම් නිරයෙහි උපන්හ. මිය යාමට පෙර ඔහුගේ පෙර උපාධ්‍යාය හිමිනමක්ව සිටි තුදු නම් බ්‍රහ්මයෙක්

අවුත් මෙම අදහස් වෙනස් කරගෙන සැරියුත් මුගලන් දෙනම කෙරෙහි ප්‍රසාදය ඇති කරවීමට උත්සාහ කළද කෝකාලික හිමි ඊට අකමැති විය. එහිදී තුදු නම් පච්චේක බ්‍රහ්මයා කෝකාලික භිකෂුවට ප්‍රකාශ කළ ගාථා දෙකකි අප මෙහි මුලින් සඳහන් කළේ. ඒ නිසා කෝකාලික භික්ෂුව කට නිසා කරගත් එම මහා අපරාධය තුළින් තම ජීවිතය අඳුරෙන් අඳුරට පත්විය.

කෝකාලික භිකෂුව මේ තත්වයට පත්වීමට හේතුව සඳහන් වන්නේ මනෝරථපූරණී නම්වූ අංගුත්තර නිකායේ අටුවා ග්‍රන්ථයේය.

කෝකාලික නම් රටේ කෝකාලික නම් සිටුවරයාගේ පුතා පැවිදි වී චූල කෝකාලික නමින් පියා විසින් කරවා දෙන ලද විහාරයක ජීවත් විය. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩවාසය කරන සමයෙහි සැරියුත් මුගලන් අගසව් දෙනම 500 භික්ෂූන් පිරිවරාගෙන ජනපද චාරිකාවේ වඩින්නේ මෙම කෝකාලික හිමියන්ගේ පන්සලට වැඩම කළහ. තමන්වහන්සේලා සමග පැමිණි භික්ෂූන් වහන්සේලා යවා මේ අගසව් දෙනම කෝකාලික හිමියන්ගේ අවසරය පරිදි එහි වස් විසීමට තීරණය කළහ. එහිදී අගසව් දෙනම ඉල්ලා සිටියේ තමන් වහන්සේලා මෙම පන්සලේ වස් කාළය තුළ සිටිනා බව ගිහි දායකයන්ට දැනගන්නට ඉඩ නොතබන ලෙසටයි. ඒ ඉල්ලීම පරිදි කෝකාලික හිමියන් අගසව් දෙනමට ඇප උපස්ථාන කරගෙන ජීවත් විය. වස් අවසන් වූ පසු අගසව් දෙනම පිටත් වී යන බව කෝකාලික හිමියන්ට කී විට ඒ හිමියන් කීවේ තව එක් දිනක් මෙහි සිට වැඩමවන ලෙසයි. අගසව් දෙනම එම ආරාධනය ඉවසූ සේක. ඉන් අනතුරුව කෝකාලික හිමියන් ගමට ගොස් දායක පිංවතුන්ට කියන්නේ වස්කාලය තුළම අගසව් දෙනම මේ පන්සලේ වැඩ සිටියත් කිසිම කෙනෙක් ඒ ගැන සොයා නොබැලූ බවයි. එවිට දායක පිංවතුන් කියා සිටියේ ඒ බව අප නොදන්නා බවයි. ඉන් පසුව දායකයින් වහ වහා සූදානම්ව චීවරාදී සිව්පසය ගෙන පන්සලට පැමිණියහ. එහිදී අගසව් දෙනම කියා සිටියේ මේ කිසිදු දෙයක් අගසව් දෙනමටවත්, කෝකාලික හිමියන්ටවත් නුසුදුසු බවයි. මේ හේතුව නිසාය කෝකාලික හිමියන් අගසව් දෙනම පිළිබඳව ආඝාතයක් හෙවත් තරහවක් ඇතිකරගත්තේ. අගසව් දෙනමට ඒවා අවශ්‍ය නැති නම් ඒවා මට දෙන්නට තිබුණා නේද? එසේ නොකළ නිසාය අගසව් දෙනමට ඉතා තදින් දෝෂාරෝපණය කළේ. ලාභ සත්කාර වල තිබෙන දරුණුකම මෙයින් වටහා ගත හැකිය. නැවතත් චාරිකාවේ වැඩම කොට එම කෝකාලික නගරයට වැඩම කළ අගසව් දෙනම හඳුනාගෙන දායක පිංවතුන් සිව්පසයෙන් සංග්‍රහ කළ විට ඒ දෙනම ඒවා පිළිගත්හ. එවිට කෝකාලික හිමියන්ගේ ද්වේශය තවත් වැඩිවිය. එදා අල්පේච්ඡව ක්‍රියා කළ අගසව් දෙනම අද මේවා පිළිගන්නේ කෙසේද කියා බුදුන් වහන්සේ වෙත ගොස් අගසව් දෙනම පාපී භික්ෂූන් බවත් පාපී අදහස් වලට නැමී ක්‍රියා කරන බවත් කියා දෝෂාරෝපණය

කළහ. බුදුන් වහන්සේ කොතෙක් කරුණු දේශනා කළත් කෝකාලිකගේ දරුණු සිත වෙනස් නොවිනි. වැරදි දෘෂ්ඨි වල පවත්නා දරුණුකම මෙයින් පෙනේ.

සමාජය තුළ ජීවත් වන විට අපේ අදහස් සමාජයටත් සමාජයේ අදහස් අපටත් හුවමාරු කරගන්නේ වචන වලිනි. එම සන්නිවේදන සම්භාෂණ ක්‍රියාවලියේදී බොරුව, කේළම, පරුසවචනය හා හිස් වචනය යන සතර වැදෑරුම් දෝෂ වලින් මිදිය යුතු බව බුදු දහමේ අදහසයි. මේ වැරදි 4 මෙහි සඳහන් වී ඇත්තේ මිනිසාගේ කටේ හටගන්නා කෙටේරි ලෙසටයි. ඒ වචන වලින් සිදුවන්නේ තමාගේ වටිනා ජීවිතය විනාසකර ගැනීමකි. කෝකාලික නම් වූ භික්ෂුව තමාගේ වචන නැමැති කෙටේරි නිසා ජීවිතය අසාර්ථක කරගත් භිසෂුවකි.

නූතන සමාජය තුළත් ගිහි පැවිදි වශයෙන් දෙවැදෑරුම් වන සමාජය තුළ මෙම ප්‍රශ්නය දැකිය හැකිය. ඒ නිසා මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ කට ප්‍රවේශම් කරගෙන සහනයෙන් ජීවත් වියයුතු බවයි. බුදුන් වහන්සේ දේශනා කොට ඇත්තේ කථා කරන්නේ නම් දැහැමි කථාවක් කළ යුතු බවයි. දම් සභා මණ්ඩපයට වඩින බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගෙන් අසන්නේ "මහණෙනි, මා එන්නට පූර්ව භාගයෙහි ඔබලා කිනම් කථාවකින් යුක්තව උන්නේද?" කියායි. එවිට භිසෂූන් කියන්නේ ඔබ වහන්සේ විසින් නොකියන්නට අනුදැන වදාළ කිසිවක් ගැන අපි කථා නොකළෙමු. අප කතා කළේ කට නිසා විනාෂ උන කෝකාලික භික්ෂුව ගැන යයි පවසති. එහිදී බුදුන් වහන්සේ දේශනා කළේ මහණෙනි කෝකාලික කට නිසා විනාෂ වූයේ අද විතරක් නොවේ. පෙරත් කට නිසා විනාෂ වූ බව දක්වා කෝකාලික ජාතකය දේශණා කළ සේක.

අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම් රජෙක් විය. එතුමා බහුභාණීය, (නිතරම කථා කරයි) වාචාලය. රජුගේ ප්‍රධාන ඇමතිතුමා වූයේ අප බෝසතාණන් වහන්සේය. ඇමතිතුමා නිතරම කල්පනා කරන්නේ තම රජතුමා මේ දුර්ගුණයෙන් වලකාගන්නේ කෙසේද කියායි. දිනක් රජතුමා මගුල් උයනේ ගල්තලාවක් මත වාඩිවී සිටී. ඊට උඩින් ඇති අඹ ගසක කපුටු කූඩුවක් ඇත. එම කූඩුවෙහි කලු කොවුල් දෙනක් බිත්තර දමා ගියාය. කැවිඩිය මේ බිත්තර රකී. පැටවුන් බිහිවූ පසු තුඩින් ආහාර ගෙනවුත් තම දරුවන් යයි සිතා පෝෂණය කරයි. පියාපත් එන්නටත් පළමුව අර කොවුල් පැටියෙක් තම කොවුල් හඬින් කෑ ගසයි. එවිට කැවිඩිය සිතන්නේ කුඩා කල පටන් වෙන හඬවලින් කෑගසන මොහු වැඩි වයසට පත්වූ විට කෙසේ කෑ ගසාවිදැයි සිතා තුඩින් ඇණ මරා බිම හෙලීය. රජතුමනි, අනවශ්‍ය ලෙස කට පාච්චිච් කරන අයට සිදුවන්නේ මෙවැනි අනතුරක් යයි පැහැදිළි කළහ. එවිට රජතුමා නිතර

කථාකිරීම, සහ වාචාල දේ කථා කිරීමෙන් වෙන්ව කටයුතු කළ බව එම ජාතක කථාව පෙන්වා දෙයි. එදා අනවශ්‍ය ලෙස හැඬුවේ අද මේ කෝකාලික භික්ෂුවයි.

සියයට 95 ක් ම බොරුව, කේළම, පරුසවචනය හා හිස්වචනය රජකරන මේ නූතන සමාජය තුළ ද ගිහි හා පැවිදි වශයෙන් ඉහත කී කෝකාලිකයන් ජීවත් වන බව ප්‍රකාශ කළ යුතුයි. ඔවුන්ටද සිදුවන්නේ එදා ජීවත්වූ කෝකාලික භික්ෂුවට සිදු වූ දේමයි. මුදලට මුල් තැන ලැබී ඇති මෙම සමාජය තුළ මුදල් ලැබෙනවානම් ඕනෑම වචනයක් කීමට බොහෝ දෙනා පෙළඹෙති. ඇට නැති දිව ඕන පැත්තකට හැරෙනවයි ගමේ කථාවක් ඇතිවී තිබෙන්නේ ඒ නිසයි. නමුත් හැමෝගේම දිව එසේ නොනැමෙන බව අමතක නොකළ යුතුයි.

බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානම සමාජමය කාර්යභාරය විය යුත්තේ ධර්ම සන්නිවේදනයයි. මෙහි ධර්මය යනු යුක්තියයි. සුදු කළු හඳුනාගෙන කළුවලින් ඈත්ව සුදු විය යුතු බව සමාජයට දැනුවත් කළ යුතුයි. එහිදී ධර්ම දේශකයාද සුදු හෝ සුදු මගට පිළිපන් කෙනෙකු විය යුතුයි. අද බොහෝ භික්ෂූන් වහන්සේලා කියන්නේ බුදු බණ නොවේ. තම අභිමතය පරිදි මොනවා හරි කියා මේවා බුදුන් වහන්සේ දේශනා කොට ඇත. නැතිනම් බණ පොතේ ඇත යනුවෙන් ප්‍රකාශ කරති. මෙවැනි අය කෝකාලික භිකෂුවගේ පාකෂිකයෝයි. ඒ නිසා ධර්මය දේශනා කරන විට බුදු දහම හොඳින් හදාරා සූත්‍රධර්ම හොඳින් කියවා බලා ධර්මය දේශනා කළ යුතුයි. එහිදී කාලය ගැන සහ ශ්‍රාවක පිරිස ගැන සිතා බලා ධර්මය දේශනා කළ යුතුයි. තම අදහසක් ඉදිරිපත් කරන්නේ නම් එය මගේ අදහසක් බව ප්‍රකාශ කළ යුතුයි. ත්‍රිපිටකයට අටුවා ලියූ බුද්ධඝෝෂ හිමියන් ඇතුළු අටුවාචාරීන් වහන්සේලා ද තම අදහසක් ඉදිරිපත් කළා නම් මේ මාගේ අදහසකි. (මෙ මයි මති) යනුවෙන් සඳහන් කර තිබේ.

ආගමික කටයුතු වලට සම්බන්ධවන ගිහි ජනතාව විවිධ කටයුතු වල නිරතවී සිටින අයය. ඔවුනට කාලය ඉතාම වටී. දිනක් මළ ගෙදරක බණ 7කි. දැන් 6 වන බණ දේශනා කරයි. එක්තරා ස්වාමීන් වහන්සේ නමක් සංවිධායක තුමාට කථා කොට මොනවා මොනවා හරි කියයි. 6 වන බණ අවසන් වූ පසු සංවිධායකතුමා මෙසේ කියයි. දැන් තිබෙන්නේ 7 වන අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම දේශනාවයි. නමුත් එම දේශනය හිමි ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා කාලගුණය අයහපත් වී ඇති නිසා එම දේශනය නොපවත්වන බව. සංවිධායකතුමා එසේ කියන විට කවුදෝ කෙනෙක් මෙසේ කියනු ඇසිනි. හොඳම ධර්ම දේශනය එය බවයි. මෙයින් පැහැදිලි වන්නේ මුලින් කළ දේශනා තුළද කෝකාලික ලකෂණ තිබී ඇති බවයි. ධර්මය දේශනා කරන ස්වාමීන් වහන්සේලා මේ ගැන කල්පනා කොට ක්‍රියා කළ යුතුයි.

නැතිනම් අපේ බණ සමාජයෙන් ප්‍රතික්ෂේප වනු ඇත. තම ශිෂ්‍යයින්ට අවවාද කරන විටද ඇතැම් ස්වාමීන් වහන්සේලා එකම දේ නිතර නිතර කියති. නොකිය යුතු දේද කියති. එවැනි දේශනාද කෝකාලික දේශනා ගනයට වැටෙයි. නූතනයේ මාධ්‍ය තුළින් දේශනා වන බොහෝ දේශනාද මේ ගණයට වැටී ඇත. නමුත් කාලය ගැන සිතා බුදු බණම දේශනා කරන ස්වාමීන් වහන්සේලාද අප අතර ඇත. එවැනි දේශකවරු සමාජයට සහනයකි.

ගිහි සමාජය දෙස බලන විටද මෙවැනිම තත්වයක් දැකිය හැක. ගිහි මහත්වරු කිහිපදෙනෙක් සමග පසුගිය දිනෙක සිංහරාජ කැළය නැරඹීමට ගියෙමි. කැළයට ඇතුල් වී ටික දුරක් යන විට ඒ අයගෙන් බොහො දෙනෙක් ප්‍රීති ඝෝෂා කළහ. ඊට හේතුව විමසන විට කීවේ සිග්නල් (ජංගම දුරකථන සංඥා) නෑ කියායි. එයින් කියවුනේ ගෙදර සිටින ස්වාමි භාර්යාව සහ දරුවන්ගෙන් එන පණිවිඩ නොලැබේ යන සතුටයි. මීට හේතුව කුමක්ද? බොහෝ ගෙවල් වල සිටින ස්වාමි භාර්යාවරු සහ දරුවන් ස්වාමිපුත්‍රයාගේ සහ පියාගේ හිත රිදෙන ආකාරයේ වචන පාවිච්චි කිරීමයි. එවැනි කෝකාලික ස්වාමි භාර්යාවන්ගෙන් සහ දරුවන්ගෙන් මිදී දින කීපයක් හෝ ගතකිරීම ඒ මහත්වරුන්ට සතුටට හේතුවිය. නමුත් සමහර මහත්වරු සිග්නල් නැතිවීම ගැන දුක්වූහ. ඊට හේතුව තම ස්වාමි දියණිය ගැන දරුවන් ගැන තොරතුරක් දැනගන්නට නොහැකි වීමයි. එයින් පෙනෙන්නේ එම ගෙවල් වල ජීවත් වන ස්වාමි භාර්යාවරු සහ දරුවන් තමාගේ සිත සතුටු වන ආකාරයේ වචන ප්‍රකාශ කරන බවයි. මේ ගැන වැඩි වැඩියෙන් සිතිය යුතු කාලය උදාවී තිබේ. මෙවැනි කෝකාලික චරිත ඇති අය මුදල් පසුපස හඹා යන විට ඔවුන්ගෙන් පිටවන වචන ඉතා දරුණුය. කෙටේරියකට උපමා කොට තිබෙන එම වචන නිසා තමනුත් විනාශ ව සමාජයත් විනාශයට පත්වී යනු ඇත. රට කරවන අයත්, රටට නිබඳවම නිරන්තරව පණිවිඩ දෙන ජනමාධ්‍ය දෙස බලන විටද පෙනී යන්නේ බොහෝ තැන්වල කෝකාලික පක්ෂය නියෝජනය වන බවයි. මුදල් ඉපයීමට පරමාර්ථ කරගත් සමහර වෙළඳ දැන්වීම් වලින් නිකුත් කරන්නේ කෝකාලික පණිවිඩය. ජනතාවට සත්‍ය හෙළිවූදාට එම කෝකාලික වෙළඳ භාණ්ඩ සමාජයෙන් ප්‍රතික්ෂේප වී යනු ඇත. ඇතැම් කෝකාලික දේශපාලඥයින් සත්‍යයෙන් තොර ප්‍රකාශ කර තම බලය ලබා ගැනීමට උත්සාහ කළත් සත්‍යය හෙළිවූ දාට බලයෙන් පහවනු ඇත. දරුණු අදහස් නිසා හිත දූෂිත කරගත් කෝකාලික මුළු ඇඟම එකම තුවාලයක් බවට පත්කරගෙන මැරී පදුම නිරයේ උපන්නේ වචනයෙන් කළ අපරාධය නිසයි. ඒ නිසා අපි කට සංවර කරගෙන නීරෝගීව සහනයෙන් ජීවත් වීමට උත්සාහ දරමු.